(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 40.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2025 මාර්තු 14 සිකුරාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

126/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024.01.01 දින සිට 2024.09.21 දින දක්වා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ශ්‍රී ලංකාව ලබා ගෙන ඇති මුළු ණය මුදල කොපමණද;

(ii) 2024.09.21 දින සිට මේ දක්වා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ශ්‍රී ලංකාව ලබා ගෙන ඇති මුළු ණය මුදල කොපමණද;

(iii) ඉහත (ii)හි සඳහන් ණය මුදල ලබා ගන්නා ලද අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(iv) එම ණය මුදල් ලබා ගන්නා ලද අරමුණ කවරේද;

(v) එම ණය මුදල් සඳහා අය කරනු ලබන පොළී ප්‍රතිශතය කවරේද;

(vi) එම ණය වාරික ආපසු ගෙවීම ආරම්භ කළ යුතු දිනය සහ ගෙවා අවසන් වන දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

155/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ සුළං විදුලි බලය සහ සූර්ය විදුලි බලය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය, ඉන්දියාවේ අදානි සමාගම හෝ එහි උප සමාගමක් සමඟ ගිවිසුම්වලට එළැඹ තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුම ඉදිරිපත් කරන්නේද;

(iii) එම ගිවිසුමේ මූලික අරමුණු කවරේද;

(iv) තරගකාරී ටෙන්ඩර් කැඳවීමකින් තොරව ඉහත සමාගමට ශ්‍රී ලංකාව තුළ විදුලිය නිෂ්පාදනය කිරීම සඳහා අවස්ථාව ලබා දෙන ලද පදනම කවරේද;

(v) ශ්‍රී ලංකා විදුලිබල පනත අනුව “රජයක් සහ රජයක් අතර” (Government to Government) යන අර්ථයට ඉහත සඳහන් සමාගම අයත් නොවන බව පිළිගන්නේද;

(vi) එම ගිවිසුම සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

190/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදුලි ගාස්තු සංශෝධනය කරන බව රජය විසින් විවිධ අවස්ථාවලදී ප්‍රකාශයට පත් කර තිබෙන බව දන්නේද;

(ii) අවසන් වරට විදුලි ගාස්තු සංශෝධනය කරන ලද දිනය කවරේද;

(iii) ඉදිරියේදී විදුලි ගාස්තු සංශෝධනය කරන්නේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iv) විදුලි ගාස්තු සංශෝධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් දීර්ඝ කාලයක් ගනු ලබන බවට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් කරනු ලබන ප්‍රකාශය සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(v) විදුලි ගාස්තු තවදුරටත් සංශෝධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

293/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 නොවැම්බර් මාසයේ ශ්‍රී ලංකාවේ පැවති අධික වැසි නිසා ඇති වූ ජල ගැලීම් හේතුවෙන් කල්මුනේ, අෂ්රෆ් අනුස්මරණ රෝහලේ ශල්‍යාගාර, දැඩි සත්කාර ඒකක, නේවාසික වාට්ටු, බාහිර රෝගී අංශය, සායන, ඖෂධ ගබඩා ඇතුළු රෝහල් පරිශ්‍රය සම්පූර්ණයෙන්ම ජලයෙන් යට වූ බවත්;

(ii) ඒ හේතුවෙන් එම රෝහලේ කටයුතු අකර්මණ්‍ය වූ බවත්;

(iii) රෝගීන්ට ප්‍රතිකාර ලබා දෙන රෝහල් පරිශ්‍ර වඩාත් සුරක්ෂිතව පවත්වාගෙන යා යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම රෝහල ජලයෙන් යට වීම නිසා සිදු වූ හානිය තක්සේරු කර තිබේද;

(ii) එසේ නම්, එම හානිය කොපමණද;

(iii) එම හානිය යථා තත්ත්වයට පත්කිරීම සඳහා ගනු ලැබූ පියවර කවරේද;

(iv) මින් ඉදිරියට එවැනි තත්ත්වයක් ඇති නොවීමට සහ රෝහල් පරිශ්‍රය වඩාත් සුරක්ෂිතව පවත්වාගෙන යෑම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

302/2024

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ සහ පෞද්ගලික අංශයේ පාසල්වල පළමුවැනි ශ්‍රේණියට වාර්ෂිකව ඇතුළත් කර ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් වන ආකාරයට පසුගිය වසර පහ තුළ ඇතුළත් කරගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iii) පසුගිය වසර තුන තුළ අ.පො.ස. (සා/පෙ) සහ අ.පො.ස. (උ/පෙ) විභාග සඳහා පෙනී සිටි සහ සමත් වූ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව සහ පෞද්ගලිකව විභාගයට පෙනී සිටි තැනැත්තන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත අ.පො.ස. (උ/පෙ) විභාගයෙන් සමත්ව රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට වෙන් වෙන් වශයෙන් දන්වන්නෙහිද?

(ආ) (i) විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ එහෙත් විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට වරම් නොලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(ii) එම ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතරින් ශ්‍රී ලංකාවේ පෞද්ගලික විශ්වවිද්‍යාලවලට ඇතුළත් වූ සංඛ්‍යාව කොපමණද;

(iii) පසුගිය වසර පහ තුළ උසස් අධ්‍යාපනය සඳහා විදේශගත වූ ශිෂ්‍ය සංඛ්‍යාව සහ විදේශ විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබන සිසුන් සඳහා වාර්ෂික ඇස්තමේන්තුගත වියදම වෙන් වෙන් වශයෙන් ශ්‍රී ලංකා රුපියල්වලින් සහ ඇමෙරිකානු ඩොලර්වලින් කොපමණද;

(iv) පසුගිය වසර පහ තුළ අධ්‍යාපනය සඳහා වන මුළු වෙන්කිරීම් සහ එය දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත — (විසිවැනි වෙන් කළ දිනය) — කාරක සභාව.
(මාර්තු 12 දින ප්‍රගතිය)

*2.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ඇල්කඩුව වැවිලි සමාගමේ වාර්ෂික වාර්තා (2012, 2013, 2014, 2015, 2016 හා 2017),— 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තිය යටතේ 2023.11.23 දින ඉදිරිපත් කරන ලද පිළිවෙළින් 2012.12.31, 2013.12.31, 2014.12.31, 2015.12.31, 2016.12.31 සහ 2017.12.31 දිනයන්ගෙන් අවසන් වූ වර්ෂ සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ඇල්කඩුව වැවිලි සමාගමේ 2012, 2013, 2014, 2015, 2016 සහ 2017 වර්ෂවල වාර්ෂික වාර්තා අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*3.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2017),— 1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනතේ 15 වගන්තිය යටතේ 2023.11.24 දින ඉදිරිපත් කරන ලද 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*4.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2018),— 1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනතේ 15 වගන්තිය යටතේ 2023.11.24 දින ඉදිරිපත් කරන ලද 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*5.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2019),— 1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනතේ 15 වගන්තිය යටතේ 2023.11.24 දින ඉදිරිපත් කරන ලද 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*6.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2020),— 1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනතේ 15 වගන්තිය යටතේ 2024.02.09 දින ඉදිරිපත් කරන ලද 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*7.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව (2020/2021),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.08.24 දින ඉදිරිපත් කරන ලද 2021.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ 2020/2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*8.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2020),— 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ 16 වගන්තිය යටතේ 2024.01.23 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*9.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2021),— 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ 16 වගන්තිය යටතේ 2024.01.23 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*10.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව (2022),— 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත යටතේ 2024.01.09 දින ඉදිරිපත් කරන ලද 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*11.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2022),— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ 2024.01.09 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.06.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*12.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2021),— 2005 අංක 38 දරන සංචාරක පනතේ 33 වන වගන්තිය යටතේ 2023.09.08 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.06.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.08.08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*13.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව (2021),— 2005 අංක 38 දරන සංචාරක පනතේ 20(2) වන වගන්තිය යටතේ 2024.03.22 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.06.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.08.08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*14.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව (2021),— 2005 අංක 38 දරන සංචාරක පනතේ 23(4) වන වගන්තිය යටතේ 2024.03.22 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදලේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.06.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.08.08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*15.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ වාර්ෂික වාර්තාව (2021),— 2005 අංක 38 දරන සංචාරක පනතේ 40(1) වන වගන්තිය යටතේ 2024.02.09 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.06.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.08.08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*16.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ වාර්ෂික වාර්තාව (2022),— 2005 අංක 38 දරන සංචාරක පනතේ 40(1) වන වගන්තිය යටතේ 2024.05.07 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.06.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.08.08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*17.

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— ගාලු උරුමය පදනමේ වාර්ෂික වාර්තාව (2021),— 1994 අංක 7 දරන ගාලු උරුමය පදනම පනතේ III කොටසේ 16 වන වගන්තිය යටතේ 2023.12.06 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ගාලු උරුමය පදනමේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.07.10 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.09.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*18.

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා,— ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික වාර්තාව (2021),— 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනතේ 31 වගන්තිය යටතේ 2023.10.17 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික තරුණ සේවා සභාවේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.07.10 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.09.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*19.

බලශක්ති අමාත්‍යතුමා,— ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ වාර්ෂික වාර්තාව (2021),— 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 2(1) වගන්තිය ප්‍රකාරව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 2023.12.13 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.07.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*20.

බලශක්ති අමාත්‍යතුමා,— ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ වාර්ෂික වාර්තාව (2022),— 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 2(1) වගන්තිය ප්‍රකාරව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 2024.03.05 දින ඉදිරිපත් කරන ලද 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.07.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*21.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— මුදල් පනත යටතේ නියෝගය,— 2012 අංක 12 දරන මුදල් පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු 2013 අංක 12 දරන මුදල් පනතේ 12 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 නොවැම්බර් 22 දිනැති අංක 2411/56 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.14 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— දේශීය ආදායම් පනත යටතේ යෝජනාව,— 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 75(1) වගන්තිය යටතේ ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ ආදායම් මත බදු ගෙවීම පැහැර හැරීම වැළැක්වීම සම්බන්ධයෙන් 2013 ජූලි 26 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදුව, 2013 සැප්තැම්බර් 17 දිනැති අංක 1828/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ ඉන්දීය ජනරජයේ ආණ්ඩුව අතර එළඹී ගිවිසුම සංශෝධනය කරමින් 2024 දෙසැම්බර් 16 දින ඇති කරගත් 2025.02.20 වැනි දින ඉදිරිපත් කරන ලද සන්ධාන පත්‍රය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත යටතේ නියෝග,— 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතේ 16 වගන්තිය සමඟ කියවිය යුතු 112 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2024 දෙසැම්බර් 22 දිනැති අංක 2415/79 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 27 දිනැති අංක 2421/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.25 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 31 දිනැති අංක 2421/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.25 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වගන්තිය යටතේ මත්පැන් සඳහා වූ සුරාබද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 10 දිනැති අංක 2418/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.27 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 01/2025 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 10 දිනැති අංක 2418/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.27 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

"විසර්ජන" පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.

---